ලංකාදීප 2
2014 ඔක්තෝබර් මස 31 වැනිදා සිකුරාදා

මුලට 1

සාදය මාරයි සල්ලි හමාරයි ටිකක් සනීපයි

වේදිකා නාට්‍යකරුවෝ විදියට සිංහල නාට්‍ය වේදිකාව බබලවන්න පුළුවන්කම තිබුණු ලොකු අයිය, වේදිකාවට පස්ස හරවලා, දේශපාලකයින්ගේ පස්ස ලෙවකන ගමන් ඒ ලොක්කන්ගේ කුණු කොන්ත්‍රාත්කාර බඩගෝස්තරවාදීන් වෙලා ආණ්ඩුවට "ජැක්" එක ගහගෙන රටට ඉතිහාසයයි, භූගෝලයයි, බණයි, කලාවයි හැම මඟුලම ගැන දේශනා කරන්නේ ආණ්ඩුවේ කුණු කොන්ත්‍රාත්වලින් එන සල්ලි ටික ගණන් කරන ගමන්. අයියලා එහෙම කරන කොට අපි අදත් කියන්නේ නාට්‍ය වේදිකාවට පොඩි මග එකක් දීපු පොඩි කොල්ලෙක් ගැන. පොඩි කිව්වට මිනිහා පොඩිම නෑ. මේ තමයි ධර්මප්‍රිය ඩයස් ගොඩක් මිත්‍රයන්ගෙ ආමන්ත්‍රණයෙන් කියනවනම් ඩයියා.

ධර්මප්‍රියගෙ අලුත් නාට්‍යය තමයි 'සාදය මාරයි සල්ලි හමාරයි'. ධර්මප්‍රිය වේදිකාව උඩ අපි මීට පෙර බොහෝ වාර ගණනක් දැකලා තියෙනවා, නළුවෙක් විදිහට නාට්‍ය නිර්මාණකරුවෙක් විදිහටත් ධර්මප්‍රිය අපට පැහැදිලි මතකයක් වේදිකාව උඩ මීට පෙර කීප වතාවක් තියල තියෙනවා. ඒ පූර්ව අදහසත් එක්ක තමයි ඔය ධර්මප්‍රියගෙ අලුත් නාට්‍ය බලන්න ගියේ. අපිට අද බලන්න ලැබෙන්නෙ බොහෝ දුරට වේදිකා නාට්‍ය කියලා බොරුවට අටවන අටමගල් තමයි වැඩිපුරම. ඒක නිසා පොඩි ගුණයක් තියෙන නාට්‍යයක් බැලුවම ඇත්තටම හිත් සතුටක් ඇති වෙනවා. මොකද ඉඳහිටලා හරි වැඩකරන්න එකෙක් දෙන්නෙක් තාම ඉන්නවා කියන එකත් ලොකු දෙයක්.

'සාදය මාරයි සල්ලි හමාරයි' ගැනම කියනවට වඩා ඒක බැලුවට පස්සේ හිතුණු පොඩි පොඩි දේවල් ටිකක් තමයි මේ කියන්නේ. මොකද ඉස්සර මේ වගේ නාට්‍යය කරපු නාට්‍යකාරයා කලා [illegible] සාරයෝ වෙලා කලාව ගණිකා වෘත්තියේ යොදවන කොට ධර්මප්‍රියලා එහෙන්ට ඇල්ලු වෙන්න නොදෙන එක අපේ වගකීමක්. ඒක නිසා ධර්මප්‍රියලගෙ පරම්පරාවෙ තවමත් බරපතළ ලෙස කුණු නොවුණු නිර්මාණකරුවෝ අනාගතය ගැන අපි අපේක්ෂාගෙන ඉන්නේ. බුදු මල්ලියේ උඹලා නම් ඔය කලාව ගැන උණු වෙලා කලාවට කොරනවා කියලා ආණ්ඩුවට හේත්තු වෙච්ච ලොකු අයියලා ආදර්ශයට ගන්න එපා. මොකද එහෙම වුණොත් උඹලා ගැනත් මේ විදියටම තමයි ඉස්සරහට අපට ලියන්න වෙන්නේ.

ධර්මප්‍රිය 'සාදය මාරයි' සිංහල වේදිකාවට ගේන්නෙ බල්ලො නරියෝ වේදිකාවට පැනලා උඩු බුරලන පසුබිමක. ජනප්‍රිය කාලේ දුවන්න පුළුවන් නාට්‍යය හදන එක තමයි මේ කාලේ ට්‍රෙන්ඩ් එක. මාර වැඩක් තමයි මේක. ඉස්සර සරච්චන්ද්‍රලා හෝ සුගතපාල සිල්වලා හෝ හෙන්රි ජයසේනලා හෝ දයානන්ද ගුණවර්ධනලා කර තියාගෙන ආපු නාට්‍ය කලාව බල්ලන්ට තියපු හැටි. සරච්චන්ද්‍රගේ නාට්‍යයේ සිංහයෙක් හිටිය කියලවත්
දයානන්ද ගුණවර්ධනගේ නාට්‍යයේ නරියෙක් හිටියා කියලවත් මේ විදියේ බාල මාර්කටින්වලට ඒක ගාව ගත්තේ නෑ. අද සත්තු ඉන්න එකම නාට්‍ය දුවන්න හේතුවක් කියලා මේවා හදන අය හිතනවද මන්දා. එදිනෙදා තමන් ප්‍රශ්න මතක් කරලා ඒකට කොලොප්පං කරලා ඔඩියන්ස් එක හිනා ගස්සන එක හොඳ නාට්‍යකාරයෙක් කරන්න ඕන වැඩක් නෙවෙයි, හැබැයි මෙහෙම නාට්‍යවල රඟපාන අයම මීඩියාවල කතා කරන්න එහෙම ආවම කලාව ගැන මාර පොර ටෝක්ස් තමයි දෙන්නේ.

ඩයස්ගේ අලුත් ඩ්‍රාමා එකේ රඟපාන ගියාන් ප්‍රනාන්දු එහෙම ඔය මේ කියන කාරණය හොඳටම දන්නවා. ධර්මප්‍රිය ඩයස් කියන නාට්‍ය අධ්‍යක්ෂවරයාට වඩා නළුවා ගැන මෙතෙක් අපට සුබවාදී බලාපොරොත්තුවක් තිබුණා, සහ පැලෙන්න තරමට මෙගා ටෙලිවල රඟපාන තුදියම මිනිහට නැති එක වගේ කාරණා එක්ක මේ බලාපොරොත්තුව තවදුරටත් අපි කියනවා "සාදය මාරයි" ඩ්‍රාමා එක බලලා යන ගමන් ඩයස් ගැන මාර [illegible] තලේ උදයසිරි වික්‍රමරත්න. උදයසිරිත් හොඳ නාට්‍යකාරයෙක්.

උදයසිරි කියන්නේ ධර්මප්‍රිය ඩයස් කියන්නේ නියපොත්තෙ ඉඳලා නළුකම් ඇගේ තියෙන නළුවෙක් කියලා. මිත්‍රයන්ගෙ මේ රෙකමදාරු කැන්සල් කරගන්න එපා කියලා ධර්මප්‍රියට විශේෂයෙන් මතක් කරන්න වෙනවා. ඇත්ත කලාකාරයෝ වෙනුවට අද ඉන්න බොරුකාරයෝ සිනමාව, ටෙලිනාට්‍යය වගේම වේදිකාවත් ආක්‍රමණය කරගෙන. ඒක නිසා තමයි අලුත් කොල්ලො කෙල්ලො කරන අවංක වැඩ ගැන අපි හොඳ අවදියෙන් ඉන්නෙ. ඒත් ඔය ප්‍රවීණයි කියලා හිතාගෙන ඉන්න බොරුකාරයෝ නම් අලුත් පරම්පරාව දිහා බලන්නෙම කුහක ඇහෙන්. ඒ අය කට ඇරිය ගමන් කියන්නේම අලුත් පරම්පරාවෙ කිසිම කෙනෙක් නෑ කියලා. ඒක නිසා එයාලා යම් දෙයක් කලාවට ඉතිහාසයේ කරලා තියෙනවනම් මේ කුහකකම නිසා ඒ ටිකත් කැන්සල් කර ගන්නවා. අපි ඒ අයටත් කියන්නෙ ගෙවල්වල ඉඳන් අලුත් පරම්පරාවෙ අයට බැණ කිය කිය ඉන්නෙ නැතුව අලුත් උන් කරන වැඩ මොන වගේද කියලා ඇවිත් බලන්න කියලා. ඔය අලුත් පරම්පරාවෙ අය කරන වැඩ බලන්න ප්‍රවීණයෝ එන්නෙම නැති තරම්. එහෙමත් කෙනෙක් තමයි අපි ඒ වගේ වැඩවලට ඇවිත් ඉන්නවා දකින්නෙ, ඒ අය ලේසියෙන්ම කරන්නෙ කාගෙන් හරි අහගත්තු ආරංචිවලින් තීන්දුවලට ඇවිල්ලා අලුත් පරම්පරාව එක පෙළට තියලා වෙඩි තියන එක.

අලුත් පරම්පරාව වැඩක් කරන්න අවංක උත්සාහයක් අරගනිද්දී ආණ්ඩුවට සෙට් වෙලා කලාව පාලනය කරන අය කරන්නෙ මොනවද කියලා තමයි අහන්න වෙන්නෙ. කලාව කරන්න පරිසරයක් හදනවා වෙනුවට මේ අයියලා කරන්නේ නායකයන්ට දිරච්ච ලුනු දෙහි තම්බලා බඩ වඩා ගන්න එක, ඕන්න දැන් දැන් එහෙම ඉදපු අයත් ආණ්ඩුවට ඔරොප්පු පාට් දාන්න යනවලු. මේවාත් රටේ ඉහළම [illegible] පිටපත් කියලා අධ්‍යක්ෂණය කෙරෙන නාට්‍යයක් වෙන්නත් බැරි නෑ. බලමුකො මොකද වෙන්නෙ කියලා. අපි නම් කියන්නේ පමා වෙලා යථාර්ථය අවබෝධ කරගෙන කලාකරුවා කලාකරුවාගේ ජොබ් එක කරන්න හිතුවොත් හොඳයි.

ධර්මප්‍රිය තවත් ඩ්‍රාමා එකක් එක්ක ඉදිරියේදී මුණගැහෙන්න අපි බලාගෙන ඉන්නවා. ධර්මප්‍රිය ඩයස් "සාදය මාරයි - සල්ලි හමාරයි" කියලා කිව්වට දේශපාලන නායකයන්ට කඩේ යාමේ ආනිසංස විදියට නගා ලොකේ ලොකු අයියලා, අක්කලා සී දෙකෙන් [illegible] විදිහ සාදය නම් මාර වුණාට සල්ලි නම් හමාර වෙලා නෑ. ඒත් අපි ධර්මප්‍රියලාට කියන්නේ [illegible] දාපන්. ඒ [illegible] විතර [illegible]

ප්‍රියන්ත කොඩිප්පිලි